# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2149/21 - 2019 නොවැම්බර් මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2019.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2012 XII

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (3), (6), හා (7) වන උපවගන්ති සමග සහ 50 වන වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදෙස් මත සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග,
සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි
ආගමික කටයුතු අමාත්‍ය.

කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2019 අංක 3 දරන සංචාරක කටයුතු (ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබාදීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිම තැනැත්තකු විසින් ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපාරයක් (මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇත්නම් හා අධිකාරියෙන් එම සේවය සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇත්නම් මිස, එම සේවය සංචාරක සේවයක් වශයෙන් පවත්වාගෙන නොයා යුතු ය.

3. සෑම ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපාරයක් ම අදාළ රාජ්‍ය අධිකාරියේ ලියාපදිංචි කළ ව්‍යාපාරයක් විය යුතු ය.

4. දැනටමත් ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තකු විසින් ම, මෙම නියෝග ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට මාස හයක කාලසීමාවක් තුළ දී, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි විය යුතු ය.


1A - G 31458 — 27 (2019/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

*ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම*

5. ලියාපදිංචි සංචාරක සේවයක් වශයෙන් ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීමට අපේක්ෂාවෙන් සිටින සෑම තැනැත්තකු විසින් ම :-

(අ) (මෙහි මින්මතු ''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, ඔහු විසින් තීරණය කරනු ලබන ආකෘතියකට අනුකූලව අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද සහ 2018 මැයි මස 16 වන දින අංක 2071/57 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ, නිශ්චිතව දක්වා ඇති ගාස්තු එම අයදුම්පත සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම අයදුම්පත පිළිබඳව තීරණය කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි බවට ඔහු විසින් සලකනු ලබන යම් පැහැදිලි කිරීම් ද ඇතුළුව ඒ හා සම්බන්ධ තවදුරටත් වූ තොරතුරු හෝ ලේඛණ ඔහු වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

7. සාවද්‍ය, නොමග යවන සුලු හෝ අසත්‍ය තොරතුරු හෝ විස්තර අන්තර්ගත බවට අනාවරණය වන යම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

8. අවශ්‍යතා අයදුම්කරු සන්තකයේ පවතින බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සෑහීමකට පත්වන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම අයදුම්කරු එම ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ලියාපදිංචි හිමිකරු වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර එම ලියාපදිංචි හිමිකරු වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

*ලියාපදිංචි ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර ප්‍රදානය කිරීම*

9. මේ නියෝග යටතේ ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමට අපේක්ෂා කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම :-

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, ඔහු විසින් තීරණය කරනු ලබන ආකෘතියකට අනුකූලව අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) 2005 අංක 38 දරන සංචාරක පනතේ 48 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද සහ 2018 මැයි මස 16 වන දින අංක 2071/57 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු එම අයදුම්පත සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

10. බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථානයේ හිමිකරුගෙන් අයදුම්පතක් ලැබීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එම බලපත්‍රය නිකුත් කිරීම සඳහා එම අයදුම්පතට අදාළ තවදුරටත් වූ තොරතුරු ලේඛන හෝ පැහැදිලි කිරීම් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත දී ඉදිරිපත් කරන ලෙස එම අයදුම්කරුට විධාන කරනු ලැබිය හැකි ය.

11. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථානයක් සඳහා වූ මෙහි උපලේඛනයේ සඳහන් කර ඇති අවම ප්‍රමිතීන් අයදුම්කරු විසින් සපුරා ඇති බවට සෑහීමට පත්වීමෙන් පසුව, ඔහු විසින් ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථානයේ හිමිකරු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය තීරණය එක් මාසයක කාලයක් ඇතුළත අයදුම්කරු වෙත ලිඛිතව දැනුම් දිය යුතු අතර බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් ඒ පිළිබඳ හේතු සඳහන් කරනු ලැබිය යුතු ය.

12. මේ නියෝගවල 11 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රය -

(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවලට එකඟව යථා පරිදි ක්‍රියා කිරීම ආරක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උචිත බවට සලකනු ලබන බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති නියම හා කොන්දේසිවලට යටත් විය හැකි ය ;

(ආ) එහි නිශ්චිතව දක්වා ඇති දිනයේ දී බලාත්මක විය යුතු ය ; සහ

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් අවලංගු කරනු ලැබුවහොත් හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබුවහොත් මිස, එම බලපත්‍රයේ නිශ්චිතව සඳහන් දිනයේ සිට වසරක කාල සීමාවක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය.

## III වන කොටස

### *සාමාන්‍ය විධිවිධාන*

13. අයදුම්කරු -

(අ) මේ නියෝග යටතේ සංචාරක සේවය ලියාපදිංචි කිරීමට හෝ එහි ලියාපදිංචි හිමිකරු වශයෙන් තමාව ලියාපදිංචි කිරීම පැහැර ඇති අවස්ථාවක දී ; හෝ

(ආ) මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් අවම ප්‍රමිතීන්වලට අනුකූල වීම පැහැර ඇති අවස්ථාවක දී ;

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ නියෝගවල 11 වන නියෝගය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

14. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධිකාරියේ අනුමතය ඇතිව, ලියාපදිංචි සහතිකයට හෝ බලපත්‍රයට සම්බන්ධ යම් නියමයක් හෝ කොන්දේසියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

15. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, පහත දැක්වෙන හේතු මත මේ නියෝගවල 8 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ මේ නියෝගවල 11 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය -

(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කර තිබීම හේතුවෙන් ;

(ආ) 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කර තිබීම හේතුවෙන් ; හෝ

(ඇ) මේ නියෝගවල 8 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයට හෝ මේ නියෝගවල 11 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයට සම්බන්ධ යම් කොන්දේසියකට අනුකූල නොවීම හේතුවෙන් ;

අවලංගු කරනු ලැබිය හැකි ය.

16. මේ නියෝගවල 11 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් -

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන ආකෘතියකට අනුකූලව ඔහු වෙත අයදුම්පතක් ඉදිරිපත් කිරීම මගින් ;

(ආ) බලපත්‍රය කල් පිරීමට පෙරාතුව වූ මාස තුනකට වැඩි නොවන කාලයක් තුළ දී ; සහ

(ඇ) 2018 මැයි මස 16 වන දින අංක 2071/57 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමය ප්‍රකාරව ගෙවිය යුතු ගාස්තු සහිතව අයදුම්පත යොමු කිරීම මගින් ;

අලුත් කරනු ලැබිය හැකි ය.

17. ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ නිකුත් කරන ලද බලපත්‍රයක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමක් හෝ නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමක් පිළිබඳ යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එම තැනැත්තා වෙත අවස්ථාවෝචිත පරිදි එම බලපත්‍රය ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම පිළිබඳව දැනුම් දෙමින් ලිඛිත සන්නිවේදනයක් ලැබීමේ දින සිට මාස එකක කාලයක් ඇතුළත, 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 51 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විනිශ්චයාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

18. සෑම ලියාපදිංචි සහ බලපත්‍රලාභී හිමිකරුවකු විසින් ම එම ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථානය මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අවම අවශ්‍යතාවලට අනුකූල වන බවට සහතික විය යුතු ය.

19. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියාපදිංචි බලපත්‍රලාභී ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථානයන් පිළිබඳව අන්තර්ගත විය යුතු විස්තර සහිත ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථාන පිළිබඳ නාම ලේඛනයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන ආකෘතියෙන් පවත්වාගෙන යෑමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

20. මේ නියෝගවල -

''ආයුර්වේදීය සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථාන'' යන්නෙන් සංචාරක ව්‍යාපාරය සඳහා ආයුර්වේදය පවත්වාගෙන යෑමට පහසුකම් සහිත කැපවුණු මධ්‍යස්ථානයක් අදහස් වේ.

## උපලේඛනය

(11 වන නියෝගය)

ආයුර්වේද සංචාරක සෞඛ්‍ය මධ්‍යස්ථාන සඳහා අවශ්‍යවන අවම අවශ්‍යතා

1. **පිහිටීම**
   අදාළ වර්ගික හෝටලයට හෝ කුඩා හෝටලයට අදාළ වූ අවම අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය.

2. **ගොඩනැගිල්ල**
   ගොඩනැගිල්ල ආයුර්වේදීය සෞඛ්‍ය පහසුකම් ලබාදීම සඳහා සුදුසු පරිදි ඉදිකළ යුතු ය.

3. **අංගනය/උයන**
   අංගනය සහ උයන ආයුර්වේදීය සෞඛ්‍ය සේවාවන්ට අදාළ අවශ්‍යතාවලට අනුකූල වන පරිදි මනාව සකස්කර පවත්වා ගෙන යායුතු අතර එහි ආයුර්වේදීය ඖෂධීය ශාක වගා කිරීම යෝග්‍ය වේ.

4. **රථ වාහන ගාල් කිරීම**
   ආයුර්වේදීය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ අමුත්තන් සඳහා වෙන් කරන ලද රථ වාහන ගාල් කිරීමේ ඉඩකඩ තිබිය යුතු ය.

5. **පිළිගැනීම/තොරතුරු**
   අමුත්තන් සඳහා ආයුර්වේදීය සෞඛ්‍ය සේවා පිළිබඳ සවිස්තර තොරතුරු ලබාගැනීම සහ සැපයීම සඳහා වෙන් කරන ලද පිළිගැනීමේ/තොරතුරු කවුළුවක් තිබිය යුතු ය.

6. **රෝගී පරීක්ෂණාගාර සහ අමුත්තන් සඳහා නැවතුම් කාමර**

   6.1 වෛද්‍යවරුන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහ පහසුකම් සහිත වූ රෝග පරීක්ෂණාගාර එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පැවතිය යුතු ය.

   6.2 මෙම කාමර සීමාංකනය කර ප්‍රමාණවත් පරිදි ආලෝකවත් කර වාතාශ්‍රය ලැබීමට සලස්වනු ලැබිය යුතු අතර මනාව නඩත්තු කරනු ලැබිය යුතු ය.

   6.3 ප්‍රතිකාර සඳහා පැමිණෙන ආගන්තුකයන් සඳහා සුවපහසු ආසන පහසුකම් සපයනු ලැබිය යුතු ය.

6.4 ආයුර්වේද දෙපාර්තමේන්තුව හෝ ආයුර්වේද වෛද්‍ය සභාව මගින් විශේෂඥභාවය දක්වමින් ආයුර්වේද වෛද්‍යවරයා වෙත නිකුත් කරන ලද සහතිකයේ පිටපතක් ආගන්තුක නැවතුම් ශාලාවේ හෝ රෝග පරීක්ෂණාගාරයේ ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

7. ආයුර්වේදීය ප්‍රතිකාර වර්ග

7.1 ආයුර්වේදීය සෞඛ්‍ය මධ්‍යස්ථාන මගින් පහත දක්වෙන ආයුර්වේදීය ප්‍රතිකාර වර්ග සපයනු ලැබිය යුතු ය.

7.1.1 පූර්ව කර්ම (ස්නේහ සහ ස්වේද කර්ම) එනම්, (අ) තෛල අභ්‍යංග සහ ශීර අභ්‍යංග, (ආ) ශීරෝධාර, (ඇ) සර්වාංගධාර, (ඈ) පින්ද සහ වාෂ්ප ස්වේධ (ඉ) අග්නි සහ නිරංග ස්වේධ

7.1.2 ප්‍රධාන කර්ම (පංච කර්ම) එනම්, (අ) වාමන කර්ම, (ආ) විරේධාන කර්ම, (ඇ) නාස්‍ය කර්ම, (ඈ) වස්ති කර්ම (ඉ) රක්ත මෝක්ෂණ කර්ම

7.1.3 පශ්චාත් කර්ම, එනම් (අ) පත්‍ය ආහාර විහරණ

7.1.4 ක්ෂුද්‍ර කර්ම, එනම් (අ) ගන්ඩූෂ, (ආ) කවලන්ගාර සහ (ඇ) අක්ෂි තර්පන

7.2 නම, වයස, පවුලේ ඉතිහාසය, ආසාත්මිකතාව, ඖෂධ වර්ග, මාත්‍රාව, දැනට ලබා දෙන ඖෂධ සහ ඖෂධ සඳහා ප්‍රතික්‍රියා අඩංගු අමුත්තාගේ/රෝගියාගේ වාර්තා පවත්වාගෙන යා යුතු ය.

8. ප්‍රතිකාර කාමර

8.1 ප්‍රතිකාර කාමර ජනීන ප්‍රදේශ වලින් ඈත්ව පිහිටා තිබිය යුතු අතර කාමර තුළ සහ අවට ප්‍රමාණවත් පුද්ගලික නිදහසක් තිබිය යුතු ය.

8.2 (අ) සම්බාහන (ආ) හුමාල ස්නාන, (ඇ) ඖෂධීය ස්නාන (ඈ) කටු චිකිත්සාව (සපයන්නේ නම්), භාවනාව සහ යෝගා සහ උපදේශනය වැනි චිකිත්සීය ප්‍රතිකාර බලාපොරොත්තු වන අමුත්තන්ගේ සංඛ්‍යාවට අදාළව ප්‍රමාණවත් ප්‍රතිකාර කාමර සංඛ්‍යාවක් සපයනු ලැබිය යුතු ය.

8.3 ස්ත්‍රීන් සහ පුරුෂයන් සඳහා වෙන් වූ ප්‍රතිකාර කාමර තිබිය යුතු ය.

8.4 ප්‍රතිකාර කිරීමේ කාර්යය සඳහා පහත දක්වෙන පහසුකම් සහ උපකරණ තිබිය යුතු ය. එනම්,

(අ) පරීක්ෂා කිරීම සඳහා ඇඳ/ඇඳන්,
(ආ) ශීරෝධාර, සම්බාහනය සඳහා දැවමය ඇඳන්
(ඇ) හුමාලය වැද්දීම සඳහා දැවයෙන් සාදන ලද (කොහොඹ යෝග්‍ය වේ) මංජුසා.

8.5 ප්‍රතිකාර කාමර තුළ ප්‍රමාණවත් ආලෝකය සහ වාතාශ්‍රය තිබිය යුතු ය.

8.6 සියලු අමුත්තන්ට නාන කබා, නාන තුවායන්, මුහුණු තුවා, අත් තුවා, ඇඳ රෙදි, සහ ඇස් ආවරණ ඇතුළු පිරිසිදු සහ සනීපාරක්ෂිත සහිත කපු රෙදි සපයනු ලැබිය යුතු ය.

9. පශ්චාත් ප්‍රතිකාර විශ්‍රාන්ති විවේකාගාරය/ප්‍රදේශය

9.1 වෙන් වූ පශ්චාත් ප්‍රතිකාර විශ්‍රාන්ති විවේකාගාරයක් හෝ ප්‍රතිකාරවලින් අනතුරුව විශ්‍රාන්ති සඳහා ප්‍රදේශයක් තිබිය යුතු ය.

9.2 එහි විවේක ගැනීම සඳහා ආසන පනවා තිබිය යුතු අතර කිසිදු කලබලයකින් තොරව විවේකීව පැවතිය යුතු ය.

**10 ඖෂධාල/ඖෂධ සැකසීමේ කාමර**

10.1 ආයුර්වේදීය සැපයුම් ගබඩා කිරීමට සහ ඖෂධ සැකසීමට ඉඩකඩ සහිත ඖෂධාලයක් තිබිය යුතු ය.

10.2 ඖෂධ සැකසීම සුදුසුකම්ලත් ආයුර්වේද වෛද්‍යවරයකුගේ හෝ ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සුදුසුකම්ලත් ඖෂධවේදීයකුගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු ය.

10.3 වෛද්‍ය උපකරණ ගබඩා කිරීම සඳහා සුදුසු රාක්ක සහ ගබඩා උපකරණ සපයනු ලැබිය යුතු අතර ඖෂධ මිශ්‍ර කිරීම සහ සැකසීම සඳහා මේස, උපකරණ සහ භාජන සපයනු ලැබිය යුතු ය.

10.4 ඖෂධාලය තුළ ගලායන උෂ්ණ සහ සිසිල් ජලය සහිත සේදීම සඳහා බේසමක් සවිකල යුතු ය.

10.5 සියලුම බෙහෙත්/ඖෂධ, අනුමත උපකරණ යොදා ගෙන පිළිගත් ප්‍රමිතීන්ට අනුව සකසනු ලැබිය යුතු ය.

10.6 නිෂ්පාදිත බෙහෙත් සහ අමුද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වෙන් වූ කාමර තිබිය යුතු ය.

10.7 සුදුසු සහ ප්‍රමාණවත් තාපන සහ පැසවීමේ ක්‍රම අනුගමනය කළ යුතු ය.

10.8 ඖෂධවේදියා විසින් නිෂ්පාදිත දිනය, කල් ඉකුත්වීමේ දිනය, භාවිත කර ඇති ද්‍රව්‍ය සහ සැපයුම්කරුවන්ගේ සහ නිෂ්පාදකයන්ගේ විස්තර ඇතුළත් ඖෂධවල ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

10.9 සෞඛ්‍ය මධ්‍යස්ථානය විසින් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නිෂ්පාදකයකු වෙතින් නිෂ්පාදිත ඖෂධ මිලදී ගත යුතු ය.

**11. ඖෂධ හෝ ආහාර පැළෑටි සම්බන්ධ මුළුතැන්ගෙය.**

11.1 අවශ්‍ය ඝන හෝ දියරමය ඖෂධ පැළෑටි ආශ්‍රිත නිෂ්පාදන, කසාය, ආලේප සහ පොට්ටනි සැකසීම සඳහා දැනුම සහ අත්දැකීම සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහිත ඖෂධ හෝ ආහාර පැළෑටි සම්බන්ධ මුළුතැන්ගෙයක් තිබිය යුතු ය.

11.2 සියලු ආයුර්වේදීය ඖෂධ සැකසීම සඳහා සෞඛ්‍ය මධ්‍යස්ථානයෙහි භාවිතා කරන්නා වූ උපකරණ සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනුමතය තිබිය යුතු ය.

**12. තාවකාලික වැසිකිළි ඒකක**

12.1 පුරුෂයන් සහ ස්ත්‍රීන් සඳහා වෙන් වූ තාවකාලික වැසිකිළි ඒකක තිබිය යුතු ය.

12.2 සෑම වැසිකිළි ඒකකයක් සඳහා ම ජලය සහිත කුටි මුහුණ සෝදන බේසම්, කණ්ණාඩි, තුවා රඳවන, ඇඳුම් රඳවන, පිරිසිදු තුවා, කඩදාසි මලු සහිත සනීපාරක්ෂක කුඩ, සබන්, සබන් තබන බන්දේසි, රඳවන සහිත වැසිකිළි කඩදාසි, වැසිකිලි පෝච්චි හෝ බිඩය සහ අත් බිඩය සහ උෂ්ණ හා සිසිල් ජලය සපයනු ලැබිය යුතු ය.

12.3 තාවකාලික වැසිකිළි ඒකකවල තිබෙන්නා වූ උපකරණ සහ සවි කිරීම් මනා ක්‍රියාකාරී තත්වයෙන් පැවතිය යුතු ය.

12.4 වැසිකිළි ඒකක ප්‍රමාණවත් ව ආලෝකමත් කර වාතාශ්‍රය සහිතව මනාව නඩත්තු කළ යුතු ය.

12.5 වැසිකිළියේ බිම් සහ බිත්ති මීටර් 1.5 දක්වා ජලය අවශෝෂණය නොකරන ද්‍රව්‍යයකින් තිබිය යුතු ය.

**13. කාර්ය මණ්ඩලය සහ පහසුකම්**

13.1 ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් පිළිගත් ආයතනයකින් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා ඇති සහකාර වෛද්‍යවරයෙකු සමග ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අවසරය ආයුර්වේද වෛද්‍ය සභාවේ අනුමතය ලත් උපදෙස් දෙන වෛද්‍යවරයකු වශයෙන් ආයුර්වේදීය සෞඛ්‍ය මධ්‍යස්ථානයට සම්බන්ධව කටයුතු කරන ආයුර්වේද වෛද්‍යවරු අවම වශයෙන් එක අයකු හෝ සිටිය යුතු ය. ඊනැම සම්ප්‍රදායික දේශීය ආයුර්වේද වෛද්‍යවරයෙකු ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ප්‍රත්‍යක්ෂ වූ වාර්තා මත අවසරය ලබාගෙන තිබිය යුතු ය.

13.2 ආයුර්වේද ප්‍රතිකාර සම්බන්ධ අවම වශයෙන් මාස හයක පුහුණුවක් ලබා ඇති පිරිමි සහ කාන්තා ප්‍රතිකාර කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටිය යුතු අතර ඔවුන්ගේ පුහුණු සහතිකය ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් අනුමත කරනු ලැබිය යුතු ය.

13.3 පිරිමි සහ කාන්තා රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමට ආයුර්වේදය සම්බන්ධව අවම වශයෙන් හය මාසික පුහුණුවක් සහ/හෝ ප්‍රායෝගික අත්දැකීම් සහිත පිරිමි සහ කාන්තා උපස්ථායකයින් සිටිය යුතු ය.

11 - 1644

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.